| 38 | ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව | පුනරාවර්ථන වියදම් | 0.24 | 0.24 | 0.22 | 92% |
| | | ප්‍රජාපාදක විශෝධන කාර්යාලය වැඩිදියුණු කිරීම | 0.01 | 0.01 | 0.01 | 100% |
| 39 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | පුත්තලම දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලයේ විදුලි පද්ධතිය අලුත්වැඩියා කිරීම | 0.40 | 0.40 | 0.30 | 75% |
| | | කාර්යාලීය පුටුවක් මිලදී ගැනීම | 0.03 | 0.03 | 0.03 | 100% |
| | | ඉඩම් පරිහරණ සැලසුම් යාවත්කාලීන කිරීම | 0.38 | 0.38 | 0.33 | 87% |
| | | ඉඩම් පරිහරණ කමිටු | 0.26 | 0.26 | 0.21 | 81% |
| | | පුනරාවර්ථන වියදම් | 0.68 | 0.68 | 0.67 | 99% |
| 40 | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | ලැප්ටොප් සඳහා SSD මිලදී ගැනීම | 0.01 | 0.01 | 0.01 | 100% |
| | | රැකියාපොළ වැඩසටහන | 0.17 | 0.17 | 1.63 | 959% |
| | | වෘත්තීය මාර්ගෝපදේශ සම්බන්ධයෙන් සිසුන් දැනුවත් කිරීම | 0.36 | 0.36 | 0.35 | 97% |
| | | මානව සම්පත් නිලධාරීන් දැනුවත් කිරීම | 0.14 | 0.14 | 0.14 | 100% |
| | | පුනරාවර්ථන වියදම් | 0.78 | 0.78 | 0.68 | 88% |
| 41 | බහුකාර්ය සංවර්ධන කාර්යසාධන බලකා දෙපාර්තමේන්තුව | පුනරාවර්ථන වියදම් | 187.96 | 187.96 | 177.85 | 95% |
| | | | 2,188.80 | 2,188.80 | 2,043.32 | 93% |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2023 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ශේෂය | 31.12.2023 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණ යට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 1,444,708,450 | 1,444,708,450 | තක්සේරු කිරීමට යොමුකර ඇත. | 90% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 473,506,684 | 473,506,684 | .......... | 100% |
| 9153 | ඉඩම් | 1,057,657,000 | 1,057,657,000 | ............. | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තා

**ජාතික විගණන කාර්යාලය**
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. NWCG/PT/A/PUT.DS/23/24/
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2024 මැයි 28 දින

ගණන්දීමේ නිලධාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
පුත්තලම

**ශීර්ෂය - 273 - පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

යථෝක්ත මූල්‍ය ප්‍රකාශනය සහතික කර ඉංග්‍රීසි හා දෙමළ පිටපත් ද සමඟ ඉදිරිපත් කරමි.

එස්. පී. වීරසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

එස්.පී.වීරසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත්:-
01. ප්‍රධාන ගණන්දීමේ නිලධාරී - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
02. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහාභාණ්ඩාගාරය

27

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මගේ අංකය / எனது இல. / My No. NWCG/PT/A/PUT.DS/23/24/40 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2024 මැයි 28 දින

ගණන්දීමේ නිලධාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
පුත්තලම

**ශීර්ෂය - 273 - පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය - 273 පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 27 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් හෙතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 3.5 (ඩ) | 14 වන බිල්පත ගෙවීම ගිවිසුම් කොන්දේසි අනුව කළයුතුව තිබිය දී ඒ අනුව කටයුතු නොකිරීමෙන් පොලී ගෙවීමට සිදුවී තිබූ බැවින්, ඒ පිළිබඳව පරීක්ෂා කර වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ක්‍රියාමාර්ග ගතයුතුය. | 3.8(ය) |
| 3.7 (ඇ) | වැඩිපුර ගෙවීම් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීම. | 3.5(ඉ) |
| 3.5 (ඵ) | ප්‍රමාදයකින් තොරව ඉඩම ලබාගෙන සැලසුම් කල පරිදි කටයුතු කිරීම. | 3.8(ඩ) |
| 2.3 | කාර්යක්ෂමව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම | 3.4 (අ) |
| 3.3 | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි කටයුතු කිරීම. | 3.7 (අ) |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක SA/GFS/01/01/08 – Volume දරන 2022 දෙසැම්බර් 20 දිනැති ලිපිය මඟින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු හඳුනාගත් ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරු කරවා ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු බව දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු බවට හඳුනාගත් ග්‍රාම නිලධාරී කාර්යාල 47, නිල නිවස 08 රජයේ පොදු ගොඩනැගිලි 13ක් හා ප්‍රජා ශාලාවක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ට අයත් විධායක සහ විධායක නොවන එකතුව වර්ග අඩි 17,317 ක් වූ නිල නිවාස 14 ක් තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් මාදම්පේ ගොවිජන සේවා කාරක සභාව භාවිතා කර නැවත භාර දී තිබූ ගොඩනැගිල්ල හා එය පිහිටි ඉඩම තක්සේරු කර ගිණුම්ගත කිරීමටහෝ යුධ හමුදා කඳවුර වෙත පැවරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බවට සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට වසා දමා දිස්ත්‍රික් ලේකම් වෙත පවරා තිබූ පාසල් 07 කට අදාල අක්කර 20 ක ඉඩම් සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 මගින් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වනවිට දීර්ඝ කාලීන බදු ලබා දී තිබූ එකතුව ආසන්නව අක්කර 3387 ක් වූ ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදී තිබුණු ට්‍රැක්ටර් හා බවුසර් 08, වතුර මෝටර් 04ක් වතුර ටැංකි 08, බෝට්ටු හා එන්ජින්මක්, ජීවිතාරක්ෂක කබා 18ක්, මෙගා ෆෝන් 01ක් හා ජීවිතාරක්ෂක කබ 01 ක් තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදී තිබූ ලොරි බවුසර් 09 ක්ද පවරා ගෙන ගිණුම් ගත කර නොතිබුණි.

(ඌ) පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ස්ථාපිත කර තිබූ **"මිස්සක"** පුත්තලම දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය වෙත විදුලි සංදේශ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය විසින් මිලදී ගෙන ලබාදී තිබූ පරිගණක 40 ක්, මොනිටර් 40 ක් සහ **UPS** 40 ක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිලි පිහිටා ඇති අක්කර 05 ක් වූ ඉඩම වටා ඉදිකර තිබූ අඩි 06ක් උස තාප්පය තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

## 1.6.2 ආදායම් නොවන ලැබීම්

-------------------------

මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු ඇමුණුම II පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශනයේ 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති අලාභ ශේෂයන් සහ 2023 වර්ෂයේ ජනවාරි 01 දිනට පෙන්නුම් කර තිබුණු අලාභ ශේෂයන් අතර එකතු වටිනාකම රු.79,362ක වෙනසක් තිබුණි.

### 1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ අඹ, කරද සහ කුඹුක් පැළ තොගයක් (ආසන්න වශයෙන් පැළ 1500 ක් පමණ) ගොඩ ගසා තිබුණු අතර, එම පැළ වර්ග ලැබීම්, බෙදා හැරීම් සහ ඊට අදාල වියදම් සම්බන්ධයෙන් පිළිගත හැකි තොරතුරක් ඉදිරිපත් නොවුණි.

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් බැරකම් ලේඛනය හා ගිනි අවි ලේඛනය මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2023 වර්ෂයේ මුළු ආදායම් සහ ආදායම් නොවන ලැබීම් රු.3,429,838,240 ක් වූ අතර ඉන් භාණ්ඩාගාර අග්‍රිම ලෙස ලැබී තිබූ මුදල රු.3,160,834,460 ක් විය. එය මුළු ලැබීම්වල ප්‍රතිශතයක් ලෙස 92.1 ක් විය. තවද රු.52,660,000 ක් නැවත භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබූ අතර එය භාණ්ඩාගාර අග්‍රිම ලෙස ලද මුදලින් සියයට 1.54 ක් විය. 2023 වර්ෂයේ මුළු වියදම රු.1,569,583,472 ක් වූ අතර එය ශුද්ධ ආදායම් හා ආදායම් නොවන ලැබීම්වලින් සියයට 46.48ක් විය.

(ආ) 2023 වර්ෂයේ මුළු වියදම පියවා ගැනීම සඳහා වෙනත් මූලාශ්‍ර ලෙස ලැබී තිබූ මුදල් රු.524,513,082 ක් භාවිතා කර තිබුණි. ඒ අනුව එමඟින් වෙනත් තෙවන පාර්ශවීය ආයතන හා පුද්ගලයන්ට ලැබිය යුතු මුදල්, ශීර්ෂයේ වියදම් පියවා ගැනීමට භාවිතා කිරීම නිසා එම ආයතනවල අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට බලපෑමක් සිදුකර තිබුණි.

### 2.2 වියදම් කළමනාකරණය

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 වර්ෂයේ වැය ලෙජරය සහ භාණ්ඩාගාර පරිගණක සටහන් අනුව වැය විෂයයන් 12 ක එකතුව රු. 159,402,469ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

(ආ) අධි ඇස්තමේන්තු සකස් කිරීම

මු.රෙ.50 අනුව ඇස්තමේන්තු හැකිතාක් සම්පූර්ණ ලෙස හා නිවැරදිව සකස් කළයුතු බව දක්වා තිබුණ ද, වැය විෂය 1403 විදුලිය හා ජලය සඳහා වර්ෂ ගණනාවක සිට අධි ඇස්තමේන්තු සකස් කරනු ලබන බව නිරීක්ෂණය වූ අතර 2023 වර්ෂයේ ඉතිරිය රු.6,710,715 ක් හෙවත් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 34 ක් වී තිබුණි.

(ඇ) 2022/2023 මහ කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ සහ නොමිලේ සහල් බෙදාදීමේ වැඩසටහන සඳහා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙතින් රු.මිලියන 200 ක් ලැබී තිබුණු අතර වී මිලට ගැනිමට හා වී සහල් බවට පත්කිරීමට රු.මිලියන 175.9 උපයෝජනය කර රු.මිලියන 24 ක් ආපසු භාණ්ඩාගාරයට යවා තිබුණි.

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) I. කල්පිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ දෙළුම් ගම්මානයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂයේ දී රු.6,988,313ක් වැයකර ගොවීන් 40 ක් සඳහා දෙළුම් පැළ, පොහොර හා ජල සම්පාදන උපකරණ ආදී වශයෙන් එක් ගොවියෙකුට රු.200,000 කට ආසන්න ප්‍රතිලාභ ලබාදී තිබුණු අතර තරුණ ප්‍රජාව කෘෂි කර්මාන්තයට අකාර්ෂණය කර ගැනීම මූලික අරමුණක් වුවද, තෝරාගෙන සිටි සියලුම ගොවීන් ව්‍යාපෘතිය ආරම්භ කරන දින වනවිටත්, වානිජ මට්ටමින් ගොවිතැන් කටයුතුවල නිරත පිරිසක් විය.

II. "රෙඩ් ඒන්ජල්" දෙළුම් ප්‍රභේදය මෙම ප්‍රදේශයට යෝග්‍යතාවය තහවුරු කර ගැනීමෙන් තොරව තෝරාගෙන තිබුණු අතර පිරිවිතරයන්ට අනුව ලේයර් පැළ සැපයිය යුතු වුවත්, නිසි ප්‍රමිතියෙන් යුක්ත නොවූ පැළ සපයා තිබූ බැවින් 2024 පෙබරවාරි 15 දින වනවිට රු.450 ක් බැගින් මිලදී ගත් පැළ 7400 කින් රු.1,535,850ක් වටිනා පැළ 3413 ක් මියගොස් තිබුණු අතර, ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ දී එකම පවුලේ සහෝදරයින් 03 දෙනෙකුට සහ සැමියා, බිරිඳ යන දෙදෙනාම ප්‍රතිලාභීන් ලෙස තෝරාගෙන තිබුණි.

III. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී දෙළුම් පැළ , ජල මෝටර්, නළ ළිඳ සහ විසුරුම් ජල සම්පාදන පද්ධති අවශ්‍ය බවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තීරණය කර තිබුණ ද, තෝරාගෙන තිබුණ ගොවීන් වෘත්තීමය ගොවීන් බැවින්, ඔවුනට අලුතින් ජල මෝටර්, නළ ළිං හා විසුරුම් ජල සම්පාදන පද්ධතිවල අවශ්‍යතාවයක් නොතිබුණු තත්ත්වයක් තුළ ඔවුන් හට ඒවා ලබාදීම සඳහා රජයේ

මුදල් රු. 3,314,000 ක් වැයකර තිබුණු අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර අදාල ගොවිබිම් පරීක්ෂා කර ඉහත පහසුකම්වල සැබෑ අවශ්‍යතාවය හඳුනාගැනීමක් සිදුනොකර එම වියදම් දරා තිබීම හේතුවෙන් ජල මෝටර්, නළ ළිං හා විසුරුම් ජල සම්පාදන පද්ධති ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) 2021 වර්ෂයේ දී වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත වේවැල් රක්ෂිතය තුළ අක්කර 15 ක වේවැල් පැළ සිටුවීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.1,973,994 ක් වියදම් කර තිබුණු අතර මිනිස් දින 465 කට රු.790,500 ක් හා වේවැල් පැළ 5250 ක් මිලට ගැනීම සඳහා රු.630,000 ක් ගෙවා තිබුණ මුත් නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නිලධාරීන් වැඩබිමේ සිට අධීක්ෂණයක් සිදුකර නොතිබුණි. සිටුවන ලද පැළ හඳුනා ගැනීමට එක් පැලයකට එක බැගින් ලී කරු සිටුවීමට රු.174,562 ක නිශ්කාර්ය වියදමක් සිදුකර තිබුණු අතර වගා කල අක්කර ගණන මැනුම් කටයුතු G.P.S. තාක්ෂණයෙන් සිදුකර තිබුණ බැවින්, නිවැරදිතාවය තහවුරු නොවිය. ඒ අනුව මෙම ව්‍යාපෘතිය තුළින් අමාත්‍යාංශය අපේක්ෂිත අරමුණු ඉටුවී ඇතැයි යන්න තහවුරු නොවිය.

(ඇ) වේවැල් පැළ සිටුවීමේ ව්‍යාපෘතියට සමගාමීව අමාත්‍යාංශ ප්‍රතිපාදන රු.1,315,368 ක වැයකර ප්‍රතිලාභීන් 14 දෙනෙකුට ඉදිකර දී තිබූ වේවැල් වැඩමඩු 14ක් අදාල කාර්යයට යොදා නොගෙන නිශ්කාර්යව තිබෙනු නිරීක්ෂණය වූ අතර නිෂ්පාදන අලෙවි කර ගැනීමේ ගැටළුව මත නිෂ්පාදන සිදු නොකරන බව ප්‍රතිලාභීන් ප්‍රකාශ කරන ලදි.

## 2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.6 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂාවේ දී අනාවරණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි | |
| මු.රෙ.756 | 2023 වසර සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නිල නිවාස 13 ක් සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි. |
| (ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | |
| i. 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන චක්‍රලේඛයේ 02(iv) වගන්තිය | වේලාව පදනම් කරගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ආදී නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කර ගන්නේ නම් එම කාලය ඇඟිලි සළකුණු යන්ත්‍රය මඟින් සනාථ කළයුතු වුවද, ඒ අනුව කටයුතු නොකරමින් පුත්තලම සහ ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මාණ්ඩලික නිලධාරීන් හට පිළිවෙලින් රු.30,365ක සහ රු.1,377,284 ක මුදලක් නිවාඩු දින රාජකාරී වැටුප් වශයෙන් ගෙවා තිබුණි. |
| ii. 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන චක්‍රලේඛය | දිප ව්‍යාප්ත සේවාවල නිලධාරීන් වසර 05 ක් එකම සේවා ස්ථානයක සේවය කර ඇත්නම් වහාම ස්ථාන මාරු කිරීමට පියවර ගතයුතු වුවත්, පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි නිලධාරීන් 355 දෙනෙකු සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. |

(ඇ) ආයතන සංග්‍රහය

---------------------

i. II බාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදය

"විගණන වාර්තාවක් මඟින් කිසියම් නිලධාරියෙකු විසින් සිදුකර තිබෙන අක්‍රමිකතාවයන් හෝ විෂමාචාරයන් පෙන්වා දී ඇති විට විධිමත් විනය පියවර ගතයුතු වුවත්, ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරියෙකු අධි ඇස්තමේන්තු සකස් කිරීමේ චෝදනාව මත චෝදනා පත්‍රයක් නිකුත් කර තිබුණ මුත් ඉදිරි ක්‍රියාමාර්ග කිසිවක් විනය බලධාරියා විසින් ගෙන නොතිබුණි.

ii. 13.12 උප වගන්තිය

මූලික විමර්ශන නිලධාරී විසින් සැකයට පාත්‍ර වූ නිලධාරියාට එරෙහිව විනයානුකූලව ක්‍රියාකිරීමට තරම් ප්‍රමාණවත් චෝදනාවන් හෙළිදරව් වන්නේ නම් චෝදනාපත්‍ර කෙටුම්පතක් සකස් කර අදාල බලධාරියා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතු අතර 14 වන වගන්ති ප්‍රකාරව විනය බලධාරියා විසින් චෝදනා පත්‍රයක් නිකුත් කිරීම කළයුතු වුවත්, අවස්ථාවන් 05 කදී එසේ කටයුතු කර නොතිබුණි.

iii. 21.1 උප වගන්තිය

විධිමත් විනය පරීක්ෂණයක විනිශ්චය සභාවක් ලෙස පත්කරනු ලැබූ නිලධාරියෙක් විසින් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා නොපමාව පරීක්ෂණ වාර්තාව විනය බලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, චෝදනා පත්‍ර නිකුත් කර වසර 01 කට වැඩි කාලයක් විනය පරීක්ෂණ කටයුතු සිදුකරමින් තිබූ අවස්ථා 02 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

iv. 22.1.1 උප වගන්තිය

යම් විෂමාචාරයක් සම්බන්ධයන් නිකුත් කරන ලද චෝදනා පත්‍රයකට අදාලව පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණය එම පරීක්ෂණය ආරම්භ කර මාස 06 ක් ඇතුළත නිමකළ යුතු හෝ අමතර කාලයක් අවශ්‍ය වනවිට ප්‍රමාණවත් කරුණු දක්වා විනය බලධාරියාගේ අනුමැතිය ඒ සඳහා ලබාගත යුතු වුවත්, නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ග්‍රාම නිලධාරිවරයෙකු සම්බන්ධයෙන් පවත්වන විනය පරීක්ෂණයට අදාලව එසේ කටයුතු කර නොතිබුණි.

v. 22 වන වගන්තිය

විනය බලධාරියෙකු වෙත ඉදිරිපත් කරනු ලබන විධිමත් විනය පරීක්ෂණයක වාර්තාව සුපරීක්ෂා කාරී ලෙස අධ්‍යයනය කොට අප්‍රමාදව තම විනය නියෝගය නිකුත් කිරීම විනය බලධාරයාගේ වගකීම වන නමුත්, විනය පරීක්ෂණ කටයුතු අවසන් කර තිබූ අවස්ථා 02 කට අදාලව විනය නියෝග නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

vi. 22.2 උප වගන්තිය

විනය පරීක්ෂණයක් සඳහා රජයට ගෙවීමට සිදුවන වියදම් අවම කර ගැනීමට නිසි පියවර ගැනීම විනය බලධාරියාගේ වගකීමක් වන නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවත්වා තිබූ හා පවත්වාගෙන යමින් තිබෙන විනය පරිකෂණ 07 ක් සම්බන්ධයෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.546,992 ක වියදමක් දරා තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

--------------------------------

i. 2.11.1 සහ(ආ) වගන්තිය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබූ අතර කමිටු රැස්වීම් පැවැත්වීමට දින වකවානු යොදාගත් ආකාරය ඒ පිළිබඳව සාමාජිකයින් දැනුවත් කළ ආකාරය තහවුරු නොවිය.

ii. 2.11.1 (ඇ) ඡේදය

ප්‍රසම්පාදන කාලසටහන, ප්‍රසම්පාදන ක්‍රමය සහ ලංසු කැඳවීමේ ලේඛන වර්ග පිළිබඳව එකඟවීම සඳහා ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව ඒකාබද්ධව පළමු රැස්වීමක් පැවැත්විය යුතු වුවත්, එවැනි ඒකාබද්ධ රැස්වීමක් පවත්වනු ලැබූ බවට සනාථ කරන ලියවිලි ලිපිගොනු තුළ නොවුණි.

iii. 4.2.1 වගන්තිය

ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලීන කළයුතු බව දක්වා තිබුණද, එසේ සිදුකර නොතිබුණි.

| | | |
|---|---|---|
| (ඉ) | ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ අංක MOD/CSD/REPORT/1/CIRCULAR (2023) දරන 2023.09.19 දිනැති චක්‍රලේඛය<br>----------------------------------<br>අංක 2023/04 හි 12.1 වගන්තිය | නියමිත කාලසීමාව තුළ ගිනි අවි බලපත්‍ර අලුත් කිරීම පැහැර හරින ගිනි අවි බලපත්‍රලාභීන් සම්බන්ධ තොරතුරු ගිනි අවි ආඥා පනත යටතේ නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාල කොට්ඨාශභාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීන් වෙත යොමු කර ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් වෙත වාර්තා කල යුතු වුවද, පුත්තලම දිස්ත්‍රික්කය තුළ 2024 වර්ෂය වනවිට ලබාදී තිබූ ගිනි අවි 1808 න් බලපත්‍ර ලබා නොගත් අනවසර ගිනි අවි 763 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 2.6 බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2012 වර්ෂයේ සිට 2023 වර්ෂය අතර කාලය තුළ කරුවලගස්වැව, ආරච්චිකට්ටුව, මුන්දලම, මාදම්පේ සහ නවගත්තේගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 කට අයත් එකතුව අක්කර 840.8 යි රූඩ 144යි පර්චස් 94 කින් යුතු ඉඩම් කැබලි 37 ක් සඳහා බදුකර සකස් කිරීමේ කටයුතු වර්ෂ ගණනාවක සිට ප්‍රමාද වෙමින් පැවතුණ බැවින්, එම ඉඩම් කැබලි බාහිර පාර්ශවයන් විසින් රජයට කිසිදු ගෙවීමක් සිදු නොකොට වානිජ හා කෘෂිකාර්මික කටයුතු සඳහා භුක්ති විඳින බව නිරීක්ෂණය විය.

(ආ) පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම නගර සීමාව තුළ පිහිටි රූඩ 02 යි පර්චස් 22 කින් යුත් අශෝක සිනමාහල පිහිටි ඉඩම 2014 වර්ෂයේ සිට නව බදුකරු වෙත වසර 30ක් සඳහා බදු ලබාදී තිබූ අතර, 2011 වර්ෂයේ සිට 2021 දක්වා අයවිය යුතු එකතුව රු.25,000,000 ක් වූ බදු මුදල් කපාහැර තිබුණි.

## 2.7 අවිධිමත් ගනුදෙනු

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(ඇ) පුත්තලම දිස්ත්‍රික් සැලසුම් අධ්‍යක්ෂකගේ නිල වාහනය සඳහා ලබා දී ඇති අංක **KV – 9200** දරන ජීප් රථය සඳහා 2023 වර්ෂය තුළ රු.526,160 ක් ඉන්ධන දීමනා ලෙස හා ඉන්ධන ඇණවුම් මඟින් ලබාදුන් ඉන්ධන වෙනුවෙන් වැයකර තිබුණු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 11/2006 හා 2006 ජූලි මස 14 දිනැති චක්‍රලේඛයේ **03.vii** ඡේදය ප්‍රකාරව නිල වාහනයක් වෙන් කරනු ලැබ ඇති නිලධාරියෙකුට සංචිත වාහනයක් ලබා නොදිය යුතු බව සඳහන් වුවද, මෙම නිලධාරියා විසින් සැලසුම් අංශයේ සංචිත වාහනය (**PC-4309)** දින 04 ක් තුළ කිලෝමීටර් 570 ධාවනය කොට ඉන්ධන ලීටර් 67 භාවිතා කර රු.20,520 ක් වැය කර තිබුණි.

(ආ) නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් තනතුර සඳහා වෙන්කර තිබුණ අංක **PC – 5068** දරන නිලරථය අලුත්වැඩියා කටයුතු සඳහා යොමු කිරීම හේතුවෙන් අංක 252 – 9873 දරන සංචිත වාහනය ප්‍රාදේශීය ලේකම් වෙත භාවිතා කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. අංක 11/2006 හා 2006 ජූලි 14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව 2023 අප්‍රේල් 06 දින සිට 2023 ජූනි 16 දක්වා වූ කාලය තුළ සංචිත වාහනය සඳහා රජයේ වියදමින් රු.142,975 ක ඉන්ධන භාවිතා කර තිබුණ අතර, ප්‍රාදේශීය ලේකම් තනතුරට හිමි මාසික ඉන්ධන දීමනාව මෙම මාස 03ක කාලය සඳහා රු.155,925 ක් ලබාගෙන තිබුණි. මේ අනුව ඉන්ධන දීමනාවට අමතරව ඉන්ධන භාවිතා කිරීම වෙනුවෙන් වැය කල රු.142,975 ක මුදලින් රු.51,150 ක් ආපසු ගෙවූ බව මේ සම්බන්ධයෙන් නිකුත් කල විගණන විමසුමට ලද පිළිතුරෙහි සඳහන් වූ අතර, ඉතිරි හිඟ මුදල වන රු.91,825 ක මුදල පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩ බලන ගණකාධිකාරීවරයාට 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා වැඩ බැලීමේ දීමනා ලෙස එකතු වටිනාකම රු.142,845 ක් ගෙවීම් කර තිබුණු අතර, ඊට අමතරව මෙම කාලය තුලදී රාජකාරී ඉටුකරන ස්ථානය වන කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගමන් කිරීම සඳහා එකතු වටිනාකම රු.97,820 ක් ගෙවා තිබුණි.

(ඈ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිනි අවි බලපත්‍ර රෙජිස්ටරයෙහි තනිකාණ්ඩ පතොරම් තුවක්කු 02 ක් විකුණූ බව සඳහන් වුවත් ඊට අදාල විස්තර දක්වා නොමැති අතර විවිධ පොලිස් වසම්වලින් ලැබී තිබූ ගිනි අවි 15 ක් වසර 40 කට ආසන්න කාලයක් ගතවී තිබුණ ද, පොත්වලට ඇතුළත් කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරිම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ එක් එක් අංශ විසින් ළඟා කරගත යුතු ඉලක්ක දැක්වෙන ක්‍රියාකාරී සැලැස්මක් 2023 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණ ද, ළඟා කරගත් ඉලක්ක හෙවත් ප්‍රගතිය දැක්වෙන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්මේ දැක්වුණු කාර්යභාරයන්ට අදාලව ළඟා කරගත් ඉලක්ක ඇතුළත් ප්‍රගති වාර්තාවක් පිළියෙල කර නොතිබීම හේතුවෙන් එම සැලැස්මේ දැක්වුණු සියලුම ඉලක්ක ළඟා කරගත්තේ ද යන්න විගණනයට තහවුරු කරගත නොහැකි විය.

3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනිම

මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආරාම පාර ජල බස්නා කාණුව සකස් කිරීම සඳහා රු.693,000 ක් වැයකර තිබුණු අතර, අයිතම අංක 02 අනුව යන්ත්‍ර මඟින් කාණු කපා තිබුණු බව නිරීක්ෂණය වුවද, 27.3m$^3$ කට මිනුම්ගෙන රු.28,665 ක් ගෙවා තිබුණි. එසේම ලෙවල් මට්ටම් ගැනීමෙන් තොරව ඉදිකිරීම නිසා කාණුවේ ජලය බැස නොයා රැඳී තිබෙන බවත් නිවාසවල ජලය කාණුවට බැස නොයන ලෙස ඉදිකිරීම නිසාත් පරික්ෂණ අවස්ථාවේ දී මහජන විරෝධතා එල්ල විය.

3.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ දී ගම්පෙරළිය වැඩසටහන යටතේ එකතු වටිනාකම රු.84,152,801 ක් වියදම් කර ක්‍රියාත්මක කර තිබුණු පානීය ජල ව්‍යාපෘති 09 ක් එම ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ඉදිරි මූල්‍ය පහසුකම් නොලැබීම මත ජනතාවගේ පානීය ජල අවශ්‍යතාව සපුරාලීම වෙනුවෙන් යොදා නොගෙන වර්ෂ 4 කට වැඩි කාලයක සිට නිශ්කාර්යව පැවතුණි.

(ආ) 2022 වර්ෂයේ අයවැය යෝජනා තුළින් ඉදිරිපත් කළ "ගම සමඟ පිළිසඳරක් " ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතු වටිනාකම රු.3,357,861 ක් වියදම් කර ඉදිකර තිබුණු "සේවා පියස" ගොඩනැඟිලි 04 ක්, බහුකාර්ය ගොඩනැඟිලි 02ක් ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට අවශ්‍ය ඉදිරි මූල්‍ය

පහසුකම් නොලැබීම මත එම ව්‍යාපෘති 06 හිම ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දමා තිබුණි.

(ඈ) සපිරිගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන - 2020 යටතේ පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 617 - ඒ, පුත්තලම උතුර ග්‍රාම නිලධාරී වසමේ රු.1,980,000ක් වැයකර ඉදිකර තිබූ සායන මධ්‍යස්ථාන ගොඩනැඟිල්ල කිසිදු කාර්යයක් සඳහා උපයෝජනය නොකර නිශ්කාර්යව තබා තිබූ අතර, සමාජ විරෝධී ක්‍රියාවන් සඳහා මෙම ගොඩනැඟිල්ල භාවිතා කරමින් පැවතුණු අතර, ගොඩනැඟිල්ලේ දොර හා ජනේලවල අල්ලු කඩා විනාශකර දමා තිබුණි.

(ඇ) 2022 වර්ෂයේ දී නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තම්මැන්නාවැටිය විහාරස්ථානය ඉදිරිපිට ශරීර සුවතා මංතීරුව ඉදිකිරීමට රු.894,311 ක මුදලක් වියදම් කර තිබුණ මුත් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වල්බිහිවී තිබුණි. අතර රජයේ මුදල් භාවිතා කර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී මහජනතාවට ප්‍රතිලාභ ලබාගත හැකිවන ව්‍යාපෘති තෝරාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2023 වර්ෂයේ සිදුකර තිබුණු අංක 02 රැස්වීම් ශාලාව ඉදිකිරීම් කටයුතු සඳහා රු.1,211,092 ක් වියදම් කර තිබුණු නමුත් භාවිතයට අවශ්‍ය අනෙකුත් උපකරණ නොමැතිවීම හේතුවෙන් නිශ්කාර්යව පැවතුණි.

**3.1.4** ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

-----------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වර්ෂ 2014 – 2019 අතර කාලය තුළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු ව්‍යාපෘති 10 ක් සඳහා එකතු වටිනාකම රු.6,692,719 කට වැඩි මුදලක් වියදම් කර තිබුණු අතර එම ව්‍යාපෘති 10 හිම ඉදිකිරීම් කටයුතු ආරම්භ කර වර්ෂ 4 – 9 දක්වා අතර කාලයක් ඉක්ම ගොස් තිබුණ ද, එම ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණු අතර එකතුව රු.3,350,849 ක් වියදම් කර ඉදිකිරීම් ආරම්භ කර තිබුණු ව්‍යාපෘති 04 ක කටයුතු අතරමඟ නවතා දමා නිශ්කාර්යව පැවතුණි.

(ආ) ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වර්ෂ 2016 සිට 2019 දක්වා කාලය තුළ රු.4,965,000ක මුදලක් වියදම් කර ආරම්භ කර තිබුණු ව්‍යාපෘති 08ක් නිම නොකර අත්හැර දමා තිබුණි.

## 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) එකතු වටිනාකම රු.94,850,311 ක් වූ මුන්දලම සහ ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි නව ගොඩනැගිලිවල ඉතිරි වැඩ නිමකිරීමේ ප්‍රසම්පාදන කටයුතුවලට අදාල පළමු ප්‍රසම්පාදන රැස්වීම 2023 අගෝස්තු 07 හා 09 දිනයන්හි ප.ව.4.00 ට පවත්වා තිබුණු නමුත්, ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී වූ බවට අත්සන් කර තිබුණු නිලධාරීන් 06 දෙනාගෙන් නිලධාරීන් තිදෙනෙකු එම දින දෙකෙහිම කාර්යාල පරිශ්‍රයෙන් පස්වරු 4.15 ට පමණ පිටව ගොස් තිබුණු බව නිරීක්ෂණය වූ අතර, විනාඩි 15 ක් වැනි කෙටි කාලසීමාවක් තුළ ප්‍රසම්පාදන කමිටුව පවත්වා ප්‍රසම්පාදන කාර්යයට අදාල තීරණය ගනු ලැබුවේ කෙසේද යන්න විගණනයේ දී මතභේදයට තුඩුදෙන්නක් විය.

(ආ) මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩනැගිල්ල සහ ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙහි ඉතිරි වැඩ නිමකිරීමට අදාලව ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම වෙනුවෙන් ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයට අතිරේක අංක 32 ට අනුකූල නොවන පරිදි එක් දිනක් පමණක් සහ සාමාන්‍ය රාජකාරී වේලාව තුළ රැස්වී තිබුණු ප්‍රසම්පාදන කමිටු වෙනුවෙන් නිලධාරීන් 09 දෙනෙකුට දීමනා ලෙස එකතුව රු.99,000 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) ප්‍රසම්පාදනයන්හි එකතු වටිනාකම රු.7,600,000 ක් වන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 වර්ෂය වෙනුවෙන් වාහන 46 ක් රක්ෂණය කිරීම සඳහා සහ පිරිසිදු කිරීමේ සේවාව ලබාගැනීම වෙනුවෙන් වූ ප්‍රසම්පාදන කටයුතු 02 සඳහා 2023 දෙසැම්බර් 28 දින පස්වරු 3.45ට පැවති ප්‍රසම්පාදන කමිටුවට සහභාගි වූ නිලධාරීන් දෙදෙනකු සහ එකතු වටිනාකම රු.564,000 ක් වන PA – 3654 දරන කැබ් රථය සඳහා ටයර් 4ක් මිලදී ගැනීමට සහ කාර්යාලයට Hard Disk 18 ක් මිලදී ගැනීමට 2023 දෙසැම්බර් 29 දින ප.ව.3.45ට පැවති ප්‍රසම්පාදන කමිටුවට සහභාගි වූ එක් නිලධාරියෙකු එම දිනයන්හි ප.ව.4.15ට කාර්යාල පරිශ්‍රයෙන් පිටව ගොස් තිබුණු අතර එක් දිනයක විනාඩි 30 ක් වැනි කෙටි කාල සීමාවක් තුළ ප්‍රසම්පාදන කටයුතු දෙකකට අදාලව ප්‍රසම්පාදන තීරණ ගනු ලැබුවේ කෙසේ ද යන්න විගණනයේ දී මතභේදයට තුඩුදෙන්නක් විය.

(ඈ) පිරිසිදු කිරීමේ සේවාව ලබාගැනීම

I. ප්‍රසම්පාදන කාර්යයෙහි වටිනාකම ආසන්න වශයෙන් රු.7,300,000 වන පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16හි 2024 වර්ෂය සඳහා පිරිසිදු කිරීමේ සේවාව ලබාගැනීම වෙනුවෙන් 2023 දෙසැම්බර් 18 දින ලංසු විවෘත කිරීමේ

කමිටුවට සහභාගී වූ බවට අත්සන් කර තිබුණු නිලධාරීන් තිදෙනාගෙන් එක් නිලධාරියෙකු බැහැර රාජකාරී ඉටු කිරීම වෙනුවෙන් දීමනා ලබාගෙන තිබුණි.

ii. පිරිසිදු කිරීමේ සේවාව පවත්වාගෙන යාමට අවශ්‍ය පිරිසිදුකාරක ද්‍රව්‍ය සේවාව සපයන ආයතනය මඟින් සපයාගත යුතු වුවත්, තාක්ෂණික ඇගයීම් වාර්තාව පරීක්ෂාවේ දී එම කමිටුවේ නිර්දේශය වී තිබුණේ ද අවම ලංසු ඉදිරිපත් කර ඇති ආයතනය වෙතින් පිරිසිදු කිරීමේ සේවාව ලබාගැනීමට වූ අතර සේවාව පවත්වාගෙන යාමේ දී අදාල ආයතනය විසින් භාවිතා කිරීමට අපේක්ෂා කරනු ලබන පිරිසිදුකාරක ද්‍රව්‍ය සම්බන්ධයෙන් කිසිදු අවධානයක් යොමු කර නොතිබුණි.

iii. 2024 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලයට පිරිසිදු කිරීමේ සේවාව ලබා ගැනීම වෙනුවෙන් ලංසු කැඳවා තිබුණු නමුත් තෝරා ගත් ආයතනය සමඟ 2024 ජනවාරි 01 සිට 2024 ජූනි 30 දක්වා කාලයට පමණක් අදාල සේවාව ලබාගැනීම වෙනුවෙන් ගිවිසුම්ගත වී තිබුණි.

iv. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.10.1 ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට 2024 වර්ෂය සඳහා පිරිසිදු කිරීමේ සේවාව සපයා ගැනීමට අදාල ආයතනය තෝරාගැනීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.10.1 හි දැක්වෙන විස්තර ඇතුළත් දැන්වීමක් ආයතනයේ වෙබ් අඩවියේ හෝ වෙනත් උචිත මාධ්‍යක පළකර නොතිබුණි.

(ඉ) දෙළුම් පැළ මිලදී ගැනීම

i. ප්‍රසම්පාදන කාර්යයෙහි වටිනාකම රු.3,600,000 ක් වන දෙළුම් පැළ මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීමේ දී "රෙඩ් ඒන්ජල්" දෙළුම් වර්ගය සඳහා මිල ගණන් ලබාදෙන ලෙස සඳහන් කර නොතිබුණු අතර, සැපයුම්කරුවන් විසින් සඳහන් කර තිබූ මිල ගණන් "රෙඩ් ඒන්ජල්" දෙළුම් පැළ සඳහා මිල බවට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණේ කෙසේ ද යන්න පැහැදිලි නොවිය.

ii. දෙළුම් පැළ මිලදී ගැනීමට තෝරාගත් ආයතන වෙත ලංසු ඉදිරිපත් කිරීමට දින 07 ක් වැනි කෙටි කාලයක් ලබාදී තිබුණු බැවින්, ලංසු ඉදිරිපත් කිරීමට එම කාලය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වූ අතර ආයතන 02 කින් පමණක් ලංසු ඉදිරිපත් කර තිබීමෙන් මේ බව වඩාත් තහවුරු විය.

iii. දෙළුම් පැළ මිලදී ගැනීම පිළිබඳ තාක්ෂණික ප්‍රමිති වාර්තාව සකස් කර තිබුණේ කුමන නිලධාරීන් විසින් ද යන්න හඳුනාගත නොහැකි වූ අතර වගකිව යුතු කිසිදු නිලධාරියෙක් විසින් එහි අත්සන් කර නොතිබුණි.

iv. ප්‍රමාණවත් ආයතන සංඛ්‍යාවකින් ලංසු නොලැබුණු තත්ත්වයක් තුළදී නැවත වරක් ආයතන කිහිපයකින් මිල ගණන් ලබාගෙන සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීම කෙරෙහි ප්‍රසම්පාදන කමිටුවේ අවධානය යොමු වී නොතිබුණි.

v. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හෝ දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ ලියාපදිංචි සැපයුම්කරුවෙකු නොවන හා ආදර්ශ දෙළුම් වගාවක් සැපයුම්කරු සතුව නොතිබිය දී ග්‍රීන් ලංකා ෆාම් ආයතනය සැපයුම්කරුවෙකු ලෙස තෝරා ගැනීමේ පදනම පැහැදිලි නොවූ අතර එම ආයතනය තෝරා ගැනීමේ දී දෙළුම්පැළ සැපයීමේ ධාරිතාවය පිළිබඳව ද අවධානය යොමු කර නොතිබුණි.

vi. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 (අ) ට අනුකූල නොවන පරිදි දෙළුම් පැළයක් රු.450 බැගින් දෙළුම් පැළ 8000 ක් රු.3,600,000 කට මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රමය ලෙස ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමේ ක්‍රමය යොදාගෙන තිබුණි.

(ඊ) 2023 අප්‍රේල් 03 දින සහ දෙසැම්බර් 06 දිනයන්හි පවත්වනු ලැබූ ප්‍රධාන ප්‍රසම්පාදන කමිටු රැස්වීම් සඳහා පැමිණි බවට අත්සන් කර තිබුණු නිලධාරීන් දෙදෙනෙකු සහ 2023 මාර්තු 29 දින පැවති සුළු ප්‍රසම්පාදන කමිටු රැස්වීම් සඳහා සහභාගී වූ බවට අත්සන් කර තිබුණු නිලධාරියෙකු විසින් එම දින සඳහා කාර්යාල පරිශ්‍රයෙන් බැහැර රාජකාරී ඉටු කිරීම වෙනුවෙන් සංයුක්ත දීමනා ලෙස රු.3,000 ක් ලබාගෙන තිබුණි.

(උ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2023 වර්ෂය තුළදී ඉටුකර තිබුණු ප්‍රසම්පාදන කටයුතු 68 ක් සඳහා ප්‍රසම්පාදන කමිටුව රැස්වී තිබුණේ අවම මිල ලබාදී තිබුණු සැපයුම්කරු තෝරා ගැනීමට පමණක් වූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1(ඇ) ප්‍රකාරව ප්‍රසම්පාදන කාර්යය ආරම්භක අවස්ථාවේ සිට අවසන් කිරීම දක්වා ඉටුකළ යුතු කාර්යයන් සම්බන්ධයෙන් තීරණ ගනු ලැබුවේ කවුරුන් විසින් ද යන්න සනාථ කරගත නොහැකි වූ අතර ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී ප්‍රසම්පාදන කමිටුවෙහි වගකීම් සහ කාර්යභාර්ය පිළිබඳව මනා අවබෝධයකින් යුතුව කටයුතු කර නොතිබුණි.

(ඌ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1(අ) ඡේදය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයන් විසින් ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් හැකිතාක් අවම කාල සීමාවක් ඇතුළත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා ප්‍රසම්පාදන කාලසටහන සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුව වෙත නිර්දේශ කොට එකඟතාවය ලබාදිය යුතු වුවත්,

2023 වර්ෂය තුළ දී ඉටුකර තිබුණු ප්‍රසම්පාදන කටයුතු සඳහා පත්කර තිබුණු තාක්ෂණික ඇගයීම් කමිටු විසින් එසේ සිදුකර නොතිබුණු අතර, තාක්ෂණික ඇගයීම් කමිටුවක වගකීම් සහ කාර්යභාර්යන් පිළිබඳව මනා අවබෝධයකින් යුතුව කටයුතු කර නොතිබුණි.

(ඵ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ දක්නට ලැබුණු පොදු අඩුපාඩු

I. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුව විසින් 2023 වර්ෂය තුළදී සිදුකර තිබුණු ප්‍රසම්පාදන කටයුතු 14 කින් ප්‍රසම්පාදන කටයුතු 12 ක සහ සුළු ප්‍රසම්පාදන කමිටුව මඟින් ලංසු කැඳවා ක්‍රියාත්මක කර තිබුණු ප්‍රසම්පාදන කටයුතු 44 හිම ලංසු විවෘත කිරීමේ කමිටුවට ප්‍රසම්පාදන කටයුතු භාරව සිටින විෂයභාර නිලධාරියා පත්කර තිබීම හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිධභාවය සම්බන්ධයෙන් අවදානමක් පවතී.

ii. ප්‍රසම්පාදන කටයුතුවලදී භාවිතා කරනු ලබන ටෙන්ඩර් පෙට්ටිය තම ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලංසුකරුවන්ට පහසුවෙන් ලඟාවීමට හැකි ස්ථානයක තැබිය යුතු වුවත්, එය සහකාර දිස්ත්‍රික් ලේකම්ගේ නිල කාමරයේ තැන්පත් කර තිබුණි.

iii. ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන් විසින් ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාවල රැස්වීමට සහභාගි වූ බවට අත්සන් කර තිබුණ ද, එම නිලධාරීන් විසින් තම නිල මුද්‍රාව යෙදීමට කටයුතු කර නොතිබුණි.

## 3.3 වත්කම් කළමනාකරණය

(අ) 2022 වර්ෂයේ සිට පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වටිනාකම තක්සේරු නොකල නිල නිවසක් සහ එකතු වටිනාකම රු.9,050,000ක් වටිනා නිල නිවාස දෙකක් භාවිතයට නොගෙන නිශ්ක්‍රියව පැවතුණි.

(ආ) වර්තමානය වන විට භාවිතා කළ හැකි තත්ත්වයේ පවතින මාදම්පේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සතු නිල නිවාසයක් සහ ගොවිජන සේවා මධ්‍යස්ථානය ලෙස හඳුනා ගන්නා ලද ගොඩනැඟිලි 02 ක් ඵලදායි ආකාරයට භාවිතා කිරීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කර නොතිබීම හේතුවෙන් විනාශ වෙමින් පවතුණි.

(ඇ) කරුවලගස්වැව ප්‍රාදේශිය ලේකම්ගේ නිල වාහනය ලෙස ලබාදී තිබූ අංක PA- 4866 දරන කැබ් රථයේ පූර්ණ එන්ජින් අලුත්වැඩියාව 2021 අගොස්තු මාසයේ දී රු.474,450 ක් වැයකර සිදුකර තිබිය දී නොසැළකිලිමත්ව වාහන ධාවනය කිරීම හේතුවෙන් නැවත ක්‍රියා

විරහිතව තිබූ අතර, අලුත්වැඩියාව සිදුකල ගරාජයේ හිමිකරු විසින් මෙම දෝෂ සම්බන්ධයෙන් වගකියුතු නොලබන බව දක්වා තිබුණි.

(ඈ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 වර්ෂයේ දී රුපියල් ලක්ෂ 15 ක් පමණ වැයකොට ස්ථාපිත කර තිබූ CCTV කැමරා පද්ධතිය වසර 5 ක පමණ කාලයක සිට අක්‍රිය වී ඇති අතර මේ වනවිටත් එය නැවත ක්‍රියකාරී තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ඉ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කාර්යාල භූමියේ කඩොලාන පැළ රෝපනය කිරීම සඳහා 2016 වර්ෂයේ දී රු.174,181 ක් වැයකර වැංකි 12 ක් ඉදිකර තිබුණු අතර, මෙම වැංකි 12 ට මේ වනවිට කැලි කසල දැමීමේ කාර්ය සඳහා භාවිතා කරමින් නිෂ්කාර්යව පවතින අතර, ආයතන භූමියක් තුළ මෙවැනි ඉදිකිරීමක් සිදුකිරීමේ පරමාර්ථය කුමක් ද යන්න නිශ්චිතව හඳුනාගත නොහැකි විය.

(ඊ) නාත්තන්ඩිය නගර සීමාවේ පිහිටි රජයට අයත් හෙක්ටයාර් 3.72 (අක්කර 09 රූඩ් 02) විශාල වානිජ වටිනාකමකින් යුතු ඉඩම 2021 වර්ෂයේ සිට වර්ෂ 2.5 කට වැඩි කාලයක් නිශ්කාර්යව පැවතුණු අතර, එම භූමිය රජයට ආදායමක් ලැබෙන අයුරින් යොදවා ගැනීම කෙරෙහි වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි. මීට පෙර මෙම ඉඩම දීර්ඝකාලීන බදු පදනම මත ලබාගෙන තිබුණු පිරාමල් ග්ලාස් සමාගම රජයට අයත් මෙම ඉඩමෙන් ඉවත් කිරීමෙන් පසු එම ආයතනය පවත්වාගෙන ගිය ගොඩනැගිලි 14 ක් සහ යන්ත්‍ර සූත්‍ර උපකරණ එම භූමියේ නිශ්කාර්යව පවතින බව සහ විනාශ වෙමින් පවතී.

**3.4 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

---------------------------------------

2021 යල කන්නයට අදාල රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන

---------------------------------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2019 - 2021 කාලය තුළ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් හරහා වී මිලදී ගැනීමට 2020/21 මහ හා 2021 යල කන්නවලදී ආණමඩුව, නවගත්තේගම හා කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල වී මෝල් හිමියන් 20 දෙනෙකු වෙත ලබාදුන් මුදල්වලින් ලංකා ස.තො.ස. වෙත 2022 මාර්තු 15 දිනට ලැබිය යුතු සහල් කිලෝග්‍රෑම් 1429338 ක් වෙනුවෙන් රු.111,208,565 ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට වගකිව යුතු නිලධාරීන් විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ අංක DFD/Paddy/2021 – 3 හා 2021 ජූලි 21 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව 2020/21 මහ කන්නයේ දී චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු නොකල අසාර්ථක වූ වී මෝල් හිමියන්/සමුපකාර සමිති 2021 යල කන්නයේ වී මිලදී ගැනීමේ කටයුතු සඳහා සම්බන්ධකර නොගැනීමට දිස්ත්‍රික් ලේකම්වරුන් වගබලා ගතයුතු බව සඳහන් කර තිබුණ ද, නවගත්තේගම කොට්ඨාශයට අයත් මෝල් හිමියන් 05 දෙනෙකු සහ ආණමඩුව කොට්ඨශයේ මෝල් හිමියන් 04 දෙනෙකු සම්බන්ධ කරගෙන තිබුණි.

(ඇ) දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ 2021 පෙබරවාරි 25 දිනැති ලිපියට අනුව කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීගේ නිර්දේශය නොසළකා ගොවිජන සේවා කාරක සභා විසින් සකස් කර ඇති පොහොර නාම ලේඛන ඇසුරෙන් වගාකල කුඹුරු අක්කර ගණන නිශ්චය කර ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් හට දන්වා තිබුණ ද, නවගත්තේගම හා ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් එම අවශ්‍යතාවය ඉටුනොකර 2021 යල කන්නයේ දී පොහොර නාම ලේඛනවල නම සඳහන් නොවූ පුද්ගලයින් 142 දෙනෙකුගෙන් වී කිලෝ 710,000 ක් මිලදී ගත් බවට ව්‍යාජ පත්‍රිකා සකස් කර රු.31,240,000 ක් ගෙවා තිබුණි.

(ඇ) 2021 යල කන්නයට අදාල වී ලබාදුන් ගොවි නාම ලේඛනයේ නම් සඳහන් ගොවීන් 11 දෙනෙකු විසින් ලබාදුන් ලිඛිත ප්‍රකාශවලට අනුව කිසිදු වී ප්‍රමාණයක් ලබාදී නොතිබිය දී ව්‍යාජ බිල්පත් සකස් කර වී කිලෝ ග්‍රෑම් 55,000 ක් සඳහා රු.2,420,000 ක් ගොවීන්ගේ ගිණුම්වලට බැරවූ පසු මෝල් හිමියන් විසින් ගොවීන්ට රු.1,000 ක් රු.1,500 ක් පමණ සංතෝෂමක් ලබාදී ආපසු මුළු මුදල ලබාගත් බව ගොවීන් ලිඛිතව ප්‍රකාශ කරන ලදි. තවද නවගත්තේගම කොට්ඨාශයේ ගොවීන් 14 දෙනෙකු විසින් වී කිලෝග්‍රෑම් 5000 වඩා අඩුවෙන් එනම්, එකතුව කිලෝග්‍රෑම් 28,000 ලබා දී තිබිය දී වී කිලෝග්‍රෑම් 5000 ක් බැගින් කිලෝග්‍රෑම් 70,000 ක් ලබාගත් බවට පත්‍රිකා සකස් කොට රු.3,180,000 බැංකු ගිණුම්වලට බැර කොට වී කිලෝග්‍රෑම් 42,000 ක මුදල වූ රු.1,848,000 ක් මෝල් හිමියන් ආපසු ලබාගෙන තිබුණි.

(ඉ) අක්කර 2 ට වැඩියෙන් වී වගා කරන ගොවියෙකුගෙන් ලබාගත හැකි උපරිම වී ප්‍රමාණය කිලෝග්‍රෑම් 5000 ක් වුවද එකම පවුලේ සාමාජිකයින් කීපදෙනෙකුගේ නම් ඇතුළත් කර වී මිලදීගත් අවස්ථා මෙන්ම වී මෝල් හිමියන් අතර වී මිලදී ගත් අවස්ථා ද නිරීක්ෂණය වූ අතර නිලධාරීන් විසින් නිසි අධීක්ෂණයක් සිදු නොකිරීම හේතුවෙන් රජයේ වී මිලදී ගැනීමේ මුක්ත පරමාර්ථය වූ ගොවියාගේ අතිරික්ත වී තොගය සාධාරණ මිලකට ලබාගැනීම හා ස.තො.ස. මඟින් පාරිභෝගිකයන්ට සාධාරණ මිලට සහල් ලබාදීම යන පරමාර්ථ ඉටුවී නොතිබුණු අතර රජයේ මුදල් අවභාවිතයට හා අයථා පරිහරණයට ඉඩහැර තිබුණි.

3.5 පාඩු හා හානි

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2022/2023 මහ කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ හා නොමිලේ සහල් බෙදාදීමේ වැඩසටහන

I. මෙම ව්‍යාපෘතිය සඳහා සුදුසු ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 න් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාලව වී මෝල හිමියන් 06 දෙනෙකු පමණක් තෝරාගෙන තිබුණු බැවින් අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 හි ගොවීන්ට මෙම වැඩසටහනට සම්බන්ධ වීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණු අතර පුත්තලම දිස්ත්‍රික්කයට අවශ්‍ය සහල් අවශ්‍යතාවයෙන් 56% ක් වවුනියාව දිස්ත්‍රික්කයෙන් ප්‍රවාහනය කිරීමට සිදුවීම නිසා ප්‍රවාහන වියදම් වශයෙන් රු.3,218,249 ක අමතර වැය බරක් දැරීමට සිදුවී තිබුණි.

II. බෙදා හරිනු ලබන සහල් වර්ගය පූර්ව වශයෙන් නිවැරදිව නිශ්චය නොකිරීම හේතුවෙන් ප්‍රතිලාභීන් රතු කැකුළු සහල් ප්‍රතික්ෂේප කිරීම නිසා සහල් ඉතිරි වී තිබීම හා නිසි ප්‍රමිතියෙන් යුත් සහල් ද යන්න පරීක්ෂා කිරීමෙන් තොරව සහල් භාර ගැනීම නිසා රු.97,600 ක් වටිනා සහල් කිලෝග්‍රෑම් 610 ක් විනාශ කිරීමට සිදුවී තිබුණු අතර, රු.650,603 කට සත්ත්ව ආහාර සඳහා වෙන්දේසි කල සහල් කිලෝග්‍රෑම් 8030 නිෂ්පාදනය කිරීමට රජයට රු.1,317,770 ක් වියදම් දරා තිබූ බැවින් රු.667,166 ක පාඩුවක් ද රජයට සිදුවී තිබුණි.

(ආ) නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාරවිල මූලික රෝහල් භූමිය පුළුල් කිරීම සඳහා භූමි ප්‍රමාණය අක්කර 02 ක පමණ ඉඩමක් පෞද්ගලික ඉඩම් හිමියෙකුගෙන් අත්පත් කර ගැනීමේ දී වන්දි මුදල් ලෙස රු.17,610,000 ක් ඉඩම් හිමියාට ගෙවා තිබූ අතර, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය රජයේ ගැසට් පත්‍රයේ පළවූ දින සිට වන්දි ගෙවා අවසන් වන දින දක්වා ඇස්තමේන්තුගත මුදලට 7% ක් බැගින් වාර්ෂික පොලී මුදලක් ගෙවිය යුතුය. මෙම ඉඩම අත්පත් කර ගැනීමට අදාල 38(අ) අතුරු විධානය 2018 නොවැම්බර් 01 දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකර තිබුණ ද, එම දිනවල වන්දි ගෙවා අවසන් නොකිරීම හේතුවෙන් වන්දි ගෙවීමට වසර 5 කට වැඩි කාලයක් ගතවී තිබීම හේතුවෙන් එම වන්දි පොලිය ගෙවූ වන්දි මුදලේ ප්‍රතිශතයක් ලෙස 34% ප්‍රමාණයක් වන රු.5,998,546 ක අතිරේක පිරිවැයක් රජයට දැරීමට සිදුවී තිබුණි.

(ඈ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රජයට පවරාගත් ගිනි අවි බලපත්‍ර ලබාදීමේ රෙජිස්ටරය අනුව විගණන දිනය වූ 2024.02.27 වන දිනට විකිණීම හෝ අපහරණය නොකරන ලද ගිනි අවි තොගයේ ප්‍රමාණය ගිනිඅවි 346 ක් වූ අතර එදිනට සිදුකරන ලද භෞතික පරීක්ෂාවේ දී ගිනි අවි 319 ක් පමණක් පැවතුණි. ඒ අනුව ලේඛන ගතකර තිබූ ගිනි අවි තොගය හා භෞතික තොගය අතර වෙනස ගිනි අවි 27 ක් විය.

(ඇ) 2008 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලැබී තිබූ වසර ගණනාවක් පැරණි ගිනි අවි 20 ක් 2024 පෙබරවාරි වනවිටත්, තක්සේරු මණ්ඩලයක් මඟින් තක්සේරු කිරීම සඳහා වගකිව යුතු නිලධාරීන් විසින් කටයුතු කර නොතිබුණ අතර, 2017 වසරෙන් පසුව ගිනි අවි තක්සේරු කිරීම් කටයුතු වාර 04 ක් පවත්වා තිබුණ ද, මෙම ගිනි අවි තොගය එම තක්සේරු කිරීම් සඳහා ඇතුළත් කරගෙන නොතිබුණි.

(ඉ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ මඟපෙන්වීම අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංවර්ධන වැඩ විෂයයන් සඳහා බොරළු කියුබ් ඒකක ස්ථානීය මිල (පැටවීම හා රාජ්‍ය භාගය ඇතුළත්ව) රු.3,000 ක් වන පළාත් මිල කමිටුවේ ස්ථානීය මිල භාවිතා කර තිබුණු ද , පුත්තලම් දිස්ත්‍රික් ලේකම්ගේ අංක DSP/TFC/CS/01/මි.ක/(1)/2021 හා 2021 ජනවාරි 01 දිනැති දිස්ත්‍රික් මිල කමිටු වාර්තාව අනුව බොරළු කියුබ් එකක් පැටවීම හා රාජ්‍ය භාගය ඇතුළත්ව ස්ථානීය මිල රු.2,000 ක් බව දක්වා තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් ව්‍යාපෘති 89 ක් සඳහා භාවිතා කරන ලද බොරළු ඝන මීටර් 7482.8 ක් හෙවත් කියුබ 2641.3 ක් භාවිතා කිරීමේ දී කියුබ් එකකින් රු.1,000 ක් බැගින් රු.2,641,300 ක අලාභයක් සිදුවී තිබුණි.

### 3.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

-----------------------------------------------

ජාතික විගණන පනතේ 42 (අ) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා යම් තොරතුරක් , ලේඛනයක්, පැහැදිලි කිරීමක්, වාර්තාවක් හෝ සාක්ෂියක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි විට වැඩකරන දින විසිඑකකට නොඅඩු කාල සීමාවක් තුල ඉදිරිපත් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී නිකුත් කර දින 21 ක් ඉක්මවා තිබූ විගණන විමසුම් 04 ක් සඳහා පිළිතුරු ලබාදී නොතිබුණි.

### 3.7 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ග්‍රාම ශක්ති පලමු සහ දෙවන අදියර යටතේ පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ට අයත් සමිති 166න් සමිති 121 ක් අක්‍රියව පවතින අතර

මෙම සමිතිවල 2023 දෙසැම්බර් 31 දින වනවිට එකතුව රු.102,385,768 ක මුදල් ශේෂයක් නිශ්කාර්යව පැවතුණි.

(ආ) කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ මූල්‍යා ප්‍රතිපාදනවලින් ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ මඟ පෙන්වීම හා අධීක්ෂණය යටතේ ග්‍රාමීය කාන්තාවන් ආදායම් උත්පාදන මාර්ගවලට යොමු කිරීම හා ආදායම් උත්පාදන මාර්ගවල නියැලී සිටින කාන්තාවන් තවදුරටත් දිරිමත් කිරීම සඳහා ක්‍රියාත්මක කර තිබුණු චක්‍රීය ණය වැඩසටහනට අදාල ව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි පවත්වාගෙන යනු ලබන චක්‍රීය ණය අරමුදල් ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.1,620,000 ක් එකී වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අරමුණු වෙනුවෙන් එම අරමුදල් යොදා නොගෙන බැංකු ගිණුම්වල නිශ්කාර්යව පැවතුණි.

(ඇ) වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ රජයට අයත් ඉඩම් අක්කර 62.5 ක ප්‍රමාණයක් විවිධ පුද්ගලයින් විසින් අනවසරයෙන් අල්ලාගෙන තිබුණු අතර මෙම ඉඩම් නැවත රජය වෙත පවරා ගැනීමට අවශ්‍ය පියවර වගකිව යුතු නිලධාරීන් විසින් ගෙන නොතිබුණි.

(ඈ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි නඩත්තු කර තිබූ ගේට්ටු සටහන් පොත්වල අදාල කාර්යාල පරිශ්‍ර වෙත පැමිණෙන හා පිටවන නිල වාහන හා සංචිත වාහනවල පැමිණීම හා පිටවීම සටහන් කර නොතිබුණි.

(ඉ) සහකාර ඉඩම් කොමසාරිස්ගේ 2023.05.04 දිනැති අංක 4/10/525.94 ලිපිය මඟින් දීර්ඝකාලීන ඉඩම් බදුදීම යටතේ වසර 30 කට යූ.එස්.පෙරේරාට ලබාදී තිබූ අක්කර 19යි රූඩ් 01 සඳහා අයකර ගතයුතු හිඟ බදු මුදල් රු.596,750 ක් හා 2023.04.21 දිනට පෙර රු.385,000 ක් අයකර ගතයුතු බව දන්වා තිබුණ ද විගණන දිනය වූ 2023.09.12 වනවිටත් එම මුදල් අයකරගෙන නොතිබුණි.

(ඊ) වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විජයපුර නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ හෙක්ටයාර් 2.2486 ක ඉඩම සඳහා අයවිය යුතු මැනුම් ගාස්තුව වන රු.55,500 ක මුදල 2021 මාර්තු 20 දිනැති ලිපිය මඟින් එම මුදල ගෙවන ලෙස දැනුම් දුන්නද වසර 3 කට ආසන්න කාලයක් ගතවූවද, මේ වනතෙක් එම මුදල අයකර ගෙන නොතිබුණි.

(උ) මුදල් රෙගුලාසි 758(1) පරිදි වාර්ෂික සමීක්ෂණයට අමතරව ඉදිහිට එහෙත් යටත් පිරිසෙයින් තෙමසකට වරක්වත් බඩු ලේඛන වවුචර් සමඟ සසඳා බඩු ලේඛන පොත සෝදිසි පරීක්ෂණයකට භාජනය කිරීමට ද තොග ශේෂයන් සමඟ සසඳා ඇත්ත වශයෙන්ම තොගයෙහි ඇති භාණ්ඩ කීපයක් හරි වැරදි බැලීම මෙම හරි වැරදි බැලීමේ ප්‍රතිඵල

භාණ්ඩාගාර 127 ආකෘතියෙහි සටහන් කොට අවශ්‍යවිට බලා ගැනීමට ගොනුකර තැබිය යුතු බව දක්වා තිබුණ ද, වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් විසින් විශේෂිත නිලධාරියෙකුට පවරා එම සෝදිසි පරීක්ෂණය සිදුකළ බවට ගොනුව අනුව නිරීක්ෂණය නොවීය.

(ඌ) හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් හලාවත ජල සම්පාදන ක්‍රමයේ කුළු මං අංක 01සහ 04 සඳහා පොල් මැස්සවත්ත නමැති ඉඩමෙහි හෙක්ටයාර් 0.030 ක් බැගින් වූ ඉඩම් කැබලි 02 ක් (හෙක්ටයාර් 0.060 ක) ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ රජයට අත්පත් කරගෙන තිබුණු අතර, ඉඩම සඳහා ව්‍යාජ හිමිකමක් ඉදිරිපත් කළ පුද්ගලයෙකුට 2007 සැප්තැම්බර් 18 දින රු.1,000,000 ක වන්දි මුදලක් ගෙවා තිබුණු අතර, ඉඩමේ නියම හිමිකාරීත්වය විසින් හලාවත දිසා අධිකරණයේ ගොනුකර තිබුණු නඩුවක ලබාදුන් තීන්දුව මත රජයට ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු පොලී මුදල වන රු.1,048,441 ක් නියම හිමිකරු වූ මුන්නේශ්වරම දේවාලයේ භාරකරුවන් වෙත ගෙවීම් කර තිබීම හේතුවෙන් ඉඩමෙහි නියම හිමිකාරීත්වය හඳුනා ගැනීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු නොකිරීම හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි මුදල එක් පාර්ශවයකටත් ගෙවිය යුතු පොලී මුදල් තවත් පාර්ශවයකටත් ගෙවීම් කර තිබුණි.

(එ) කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කන්දකුලිය ට්‍රාන්ස්ෆෝමර් සිට මුස්ලිම් විදුහලට යන පාර තාර දැමීම ගෙවීම් වාර්තාව අනුව මාර්ගයේ තාර දැමූ කොටස 361.46 m² ක් ලෙස මිනුම්ගෙන ගෙවීම් කර තිබුණද, භෞතිකව නිරීක්ෂණය වූයේ 334.8 m² බැවින්, 26.66 m² කට රු.2,715 බැගින් රු.72,373 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි..

(ඒ) කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සෞභාග්‍ය සමෘද්ධි නිෂ්පාදන ගම්මාන වැඩ සටහන - 2021 යටතේ 2021 හා 2022 වර්ෂවල එකතුව රු.6,837,484 වැයකර ඉදිකර තිබූ කන්දකුලිය අගය එකතු කල කරවල නිෂ්පාදන ගම්මානය 2023 දෙසැම්බර් 31 දින වනවිට ද කරවල වෙළීමෙන් තොරව නිශ්කාර්යව පැවතුණි.

එසේම දැල් වැට සඳහා යොදා තිබූ 25 mm GI බටවල තිසි පරිදි තීන්ත ආලේප කර නොතිබීම හා බට සම්බන්ධ වන ස්ථානවලට යොදා තිබූ PVC කොටස් ගැලවී ගොස් තිබූ බැවින්, බට තුලට ජලය යාම නිසා බට මළබැඳ තිබුණි. එසේම රු.50,000 ක් වැය කල ගේට්ටු පියන් දෙක හා රු.113,388 ක් වැයකල ජලනල උපකරණ කඩා දමා විනාශ කර තිබුණු අතර රු.29,850 ක් ගෙවා තිබූ අහල් 1 ½ PVC Gate value 25 ක් සවිකර නොතිබුණි

(ඔ) මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කම්මන්දළුව ග්‍රාමයේ අත්‍යවශ්‍ය ස්ථාන සඳහා පෙට්ටි බෝක්කු 04 ක් ඉදිකිරීමේ දී බෝක්කුව සඳහා අත්තිවාරම් කාණු කැපීමේ දී බැකෝ

යන්ත්‍ර මඟින් සිදුකර තිබුණ ද, යන්ත්‍ර පැය රේට්වලට නොගෙවා ඝන මීටර් 37.02 ක් ලෙස මිනුම් ගෙන ඝන මීටරයකට රු.1,152 බැගින් රු.42,647 ක් ගෙවා තිබුණි.

(ඔ) වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදුකර තිබුණු ඉදිකිරීම් කටයුතු

---

I. වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ලෙහි සතුන්ගෙන් වන හානි වළක්වා ගැනීම සඳහා අඟල් 06 ක් පළල ලෑලි යෙදීමට දිග මීටර් 91.4 කට රු.91,948 ක් ගෙවා තිබුණු නමුත් දිග මීටර් 13.8ක කොටසක් නිරීක්ෂනය නොවූ අතර, ඒ සඳහා දරා තිබුණු වියදම රු.13,883 ක් විය.

II. වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති පැරණි ගරාජය නවීකරණය කොට ගබඩාවක් බවට පත්කිරීමේ ව්‍යාපෘතියේ දී මෙම කාමරයෙහි ඇතුළත මීටර් 0.225 ක් (අඟල් 9 ක්) උසට බොරළු පිරවීමට ඝන මීටර් 5.66 ක් වෙනුවෙන් රු.35,381 ක් ගෙවා තිබුණ මුත් මීටර් 0.225 ක් උසට බොරළු පිරවීමේ අවශ්‍යතාවයක් නිරීක්ෂණය නොවුණි.

III. වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය උදාසිරිගම ප්‍රජාශාලාව අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය යටතේ වහලය සඳහා නව ඇස්බැස්ටෝස් ෂීට් යෙදීමට ගෙවීම් වාර්තාවට අනුව 2 x 9.62m x 3.85m = 74.07 $m^2$ ලෙස මිනුම්ගෙන ගෙවා තිබුණ ද, වහලයේ එක් පැත්තකට පමණක් නව ෂීට් යොදා තිබුණු බැවින්, 37.04 $m^2$ ක ප්‍රමාණයකට රු.70,076 ක් වැඩිපුර ගෙවා තිබුණි.

IV. වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහනගම ක්‍රීඩාංගනය වටා ආරක්ෂිත වැටක් (චේන්ලින්ක්දැල) ඉදිකිරීම ලෙස රු.960,700 ක් වියදම් කර තිබුණ ද, එතුලින් ක්‍රීඩාංගනයේ ආරක්ෂාව හෝ අනවසර අල්ලා ගැනීම්වලට ස්ථිර විසඳුමක් නොවූ අතර නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඍ) ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අඹකැලේ සුසාන භූමියේ වැට සකස් කිරීමට මීටරයකට රු.2,234 ක් බැගින් මීටර් 87 ක් සඳහා රු.194,358 ක් ගෙවා තිබුණු අතර, කම්බි කාණුවක් සඳහා මිලිමීටර් 6 කම්බි 4 ක් යෙදිය යුතු වුවද, කම්බි 02 ක් පමණක් යොදා තිබුණි.

(ට) ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැල්ලන්කුලම ග්‍රාමයේ පිහිට අක්කර 25 රූඩ් 02 පර්චස් 15 ක ඉඩම ප්‍රථම බදු කාලය 2018 ජනවාරි 25 අවසන් වී තිබූ බැවින්, අදාල ඉඩම රජයේ ඉඩමක් බවට පත්වී ඇති බැවින් විධිමත් තෝරා ගැනීමක් යටතේ දීර්ඝකාලීන බදු ලබාදීම සලකා බැලීමට අදාල නිර්දේශ වාර්තා ඉඩම් කොමසාරිස් වෙත එවන ලෙස

දන්වා තිබුණ ද, ඒ අනුව කටයුතු නොකර වීඩිමත් කෘෂිකාර්මික සංවර්ධනයක් සිදුකර නොතිබිය දීත් පැරණි බදුකරු වෙත ලබාදී තිබුණි.

(ඨ) ඉදිකරමින් පැවති දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රධාන ගොඩනැගිල්ලේ 14 වන බිල්පත ගෙවීම ප්‍රතික්ෂේප කර තිබූ අතර, බේරුම් කරන ක්‍රියාවලියකට ගොස් 14 වන බිල්පත ගෙවීමට සිදුවීමෙන් ප්‍රමාද පොලී ලෙස රු.10,349,580 ක් ගෙවීමට සිදුව ගෙවීමට සිදුවී තිබුණි.

(ඩ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වර්තමාන තක්සේරු වටිනාකම රු.255,800,000 ක් වූ නිල නිවාස 08 පිහිටි අක්කර 01 යි රූඩ 02 යි, පර්චස් 14.7 ක් වූ ඉඩම පුත්තලම නගර සභාව විසින් ඉදිකරනු ලබන ඇල්ලා වෙළඳ සංකීර්ණය හා එහි රථවාහන අංගනය සඳහා පුත්තලම නගර සභාවට පවරා ගෙන ඒ වෙනුවට පුත්තලම ඩිපෝව අංගනය අසල නගර සභාවට අයත් ඉඩමෙන් අක්කර 01 ක් ලබාදී, නිල නිවාස 08 හි වර්තමාන තක්සේරු වටිනාකමට සමාන නිල නිවාස 04 ක් ඉදිකිරීමට අවශ්‍ය මුදල් දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදීමට එකඟතාවය ලබාගෙන තිබුණ ද, පුද්ගලයින්ට පදිංචියට සුදුසු තත්ත්වයේ ඇති මෙම නිල නිවාස 08 න් 04 ක තක්සේරු කිරීමටත් පෙර කඩා ඉවත් කර තිබුණ ද, 2024 මාර්තු වන විටත් ඉඩම පැවරීමේ කටයුතු අවසන් කර නොතිබුණු අතර තීරණය කරගත් පරිදි නිල නිවාස 04හි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

**4. මානව සම්පත් කළමනාකරණය**

---

**4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය**

---

**පහත කරුණු නිරීක්ෂණය විය.**

(අ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු 12 කට අදාලව සේවක පුරප්පාඩු සංඛ්‍යාව 23 ක් ද එක් තනතුරකට අදාලව නිලධාරීන් 09 කගේ අතිරික්තයක් විය.

(ආ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු 13 කට අදාලව පුරප්පාඩු 314 ක් සහ සංවර්ධන නිලධාරි තනතුරට අදාලව නිලධාරීන් 116 ක අතිරික්තයක් විය.

එස්. පී. විරසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

එස්.පී.විරසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

## 04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක ( ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව )

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක්(%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | **75% -100%** | **50% - 74%** | **0% - 49%** |
| මානව සම්පත් සංවර්ධන දේශිය හා විදේශිය පුහුණුව | | | 14.25 % |
| ප්‍රසම්පාදන සැලැස්ම අනුගතවීම | 87 % | | |
| වාර්ෂික ඇස්තමේන්තු තුළින් සපයා ගන්නා ප්‍රතිපාදන ප්‍රශස්ත උපයෝජනය | 83 **%** | | |
| දිස්ත්‍රික්කයට ලැබෙන සියළුම මූල්‍ය ප්‍රතිපාදන අපේක්ෂිත ඉලක්ක කරා මෙහෙයවීම | 85 % | | |
| නව ඉඩම් පත්‍ර ලබාදීම | 197 % | | |
| සුළු හෝ මධ්‍ය පරිමාන ව්‍යවසායකයන් බිහි කිරීම | 598 **%** | | |
| ආහාර සුරක්ෂිතාව ඇති කිරිමෙහිලා ගෙවතු ඇති කිරීම | 295 **%** | | |
| ආබාද සහිත පුද්ගලයන් සවි බල ගැන්වීම | 197 **%** | | |
| අපේක්ෂිත තරුණ ප්‍රජාවට **NVQ 3** හෝ ඊට ඉහල වෘත්තීය නිපුණතාවක් ලබා දීම | 102 % | | |



## 05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

තිරසාර සංවර්ධනයේ මූලික පරමාර්ථය වන්නේ ජාතියක ස්වභාවික සම්පත් වර්තමානයේදී ඵලදායී ලෙස කළමනාකරණය කරමින් අනාගත පරපුර සඳහා සංරක්ෂණය කිරීමයි. මේ අනුව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන 2015 දී තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) 17ක් එළිදක්වන ලද අතර, ඒවා 2030 වන විට සාමාජික රටවල් 193ක් විසින් ඉටු කිරීමට නියමිත අතර ක්ෂේත්‍ර 17ක් පුරා විහිදේ. එබැවින්, මානව, සමාජීය, ආර්ථික සහ පාරිසරික අංගවල මූලික කුළුණු එකට ගැටගැසීමෙන්, පාරිසරික තිරසාරත්වය, සමාජ තිරසාරභාවය සහ ආර්ථික සංවර්ධනය තුළින් තිරසාර සංවර්ධනයක් කරා ආර්ථිකයන් මෙහෙයවීම ඉලක්කය වේ. රාජ්‍ය අංශය, රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ එක්ව, වසර 2030 වන විට තිරසාර සංවර්ධනයේ ඉලක්ක සහ ඉලක්ක සපුරාලීමට ශ්‍රී ලංකාව මූලිකත්වය ගනිමින් සිටී.

ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ආයෝජන කඩිනම් කිරීම, ප්‍රමුඛතා අංශ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් " සෑම තැනකම සංවර්ධන උපාය මාර්ග මෙහෙයවීම මෙම SDG හි මූලික හා ප්‍රමුඛතම ඉලක්කය සපුරා ගැනීම සඳහා අවශ්‍ය වේ.

### 5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණය ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%74 % | 75%-100% |
| **01.** සෑම තැනකම සෑම ආකාරයකම දරිද්‍රතාව තුරන් කිරීම | සියළුම ආකාරයේ දරිද්‍ර තාවයන්ගෙන් පෙළෙන සියළුම වයස් කාණ්ඩවලට අයත් පිරිමින් කාන්තාවන් හා ළමුන්ගේ අනුපාතය 2025 වනවිට අවම වශයෙන් අඩකින් අඩු කිරී | • දරිද්‍රතාවෙන් පෙළෙන පවුල්වල රැකියා අපේක්ෂිත තරුණ තරුණියන් 700 ක් රැකියා ගත කිරීම | | | 93% |
| | | • පුහුණු වැඩසටහන් 200 ක් පැවැත්වීම | | | 100% |
| | | • ව්‍යාපාර ආරම්භ කිරීමට ණය 16 දෙනෙකුට ලබා දීම | | | 95% |
| | | • මත් නිවාරණ දැණුවත් කිරීම් වැඩසටහන් 16 ක් පැවැත්වීම | | | 100% |
| | | • පුද්ගලයින් 50 ට ස්වයං රැකියා ආධාර ලබා දීම හා යොමු කිරීම් | | | 90% |
| | | • ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 100 ක් පැවැත්වීම | | | 100% |
| **02. සාගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාවය හා ඉහළ පෝෂණ තත්ත්වයක් සාක්ෂාත් කර ගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.** | 2030 වර්ෂය වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන් දරුවන් ද ඇතුලත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන හා අවධානමට ලක්ව තිබෙන ජනතාවට ආරක්ෂාකාරි පෝෂණයෙන් යුත් ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම | • ආහාර හා පෝෂණය පිළිබඳව දැනුවත් කිරීමම වැඩසටහන් 16 ක් පැවැත්වීම | | | 100% |
| **03.නිරෝගී ජීවිතයක් තහවුරු කිරීම සහ සෑම වයසකදීම යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම** | 2030 වන විට බෝනොවන රෝග නිසා සිදුවන අකල් මරණ ප්‍රතිකාර මඟින් හා වලක්වා ගැනීමේ ක්‍රම මඟින් 1/3 කින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍ය හා යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම | • ක්‍රීඩා උපකරණ ලබාදීම සහ ක්‍රීඩා පුහුණුව 05 ක් සිදු කිරීම | | | 75% |
| **04.පරිපූර්ණ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් ලැබීම තහවුරු කිරීම සහ සැමට ජීවිත කාලය පුරාම අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව ප්‍රවර්ධනය කිරීම.** | 2030 වන විට ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවන ආකාරයෙන් සියළුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස් සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ ප්‍රාථමික හා ද්විතික අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම . | • ද්විතීය අධ්‍යාපනයෙන් පසු තරුණ තරුණියන් 2000 ක් ඵලදායී තෘතිය අධ්‍යාපනයට යොමු කිරීම | | | 110% |
| | | • සිසුන් 2500 ක් සඳහා වෘත්තිය මාර්ගෝපදේශ ලබා දීම | | | 100% |
| | | • දැනුවත් කිරීමේ වැඩසටහන් 76 ක් පැවැත්වීම | | | 100% |
| | | • ශිෂ්‍යත්ව ප්‍රතිලාභ 8ක් ලබා දීම | | | 100% |

| | | | | | |
|---|---|---|---|---|---|
| **05.ස්ත්‍රී, පුරුෂ සමානාත්මකතාවය අත්පත් කර ගැනීම සහ සියළු කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබල ගැන්වීම.** | කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහිව සියළුම ස්ථානවල සිදු වන්නා වූ සියළුම ආකාරයකම වෙනස්කොට සැලකීම් තුරන් කිරීම. | • හිංසනයට මුහුණ දෙන්නන් වෙනුවෙන් මනෝ සමාජීය උපදේශන සහාය වැඩසටහන් 16 ක් පැවැත්වීම | | | 100% |
| **06. සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරිම .** | 2030 වන විට සියළු දෙනාටම සමානත්වයෙන් යුක්තව සනීපාරක්ෂාව සහ ස්වස්තතාව ලබා ගැනීමට හැකියාව සහ එළිමහනේ මළපහ කිරීම තුරන් කිරීම සහ විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ගැහැණු ළමුන්ගේ සහ අවධානමට ලක් වී සිටින පුද්ගලයන්ගේ විශේෂ අවශ්‍යතාවයන් කෙරෙහි අවධානය යොමු කිරීම . | • සෞඛ්‍ය ආරක්ෂිත වැසිකිලි නොමැති පවුල් සඳහා වැසිකිලි 16 ක් ඉදිකිරීම. | | | 75% |
| | | • පාසල් දරුවන් හා වැඩිහිටියන් දැනුවත් කිරීමේ වැඩසටහන් 16 ක් ක්‍රියාත්මක කිරීම. | | | 100% |
| **08. සියල්ලන් සඳහාම පෝෂිත පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායිව සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම.** | ළමා ශ්‍රමය තහනම් කිරීම, කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම, සියළු සේවකයන් සඳහා ආරක්ෂාකාරි සේවා පරිසරයක් තිබීම ප්‍රවර්ධනය කිරීම | • වෘත්තීය මාර්ගෝපදේශ සේවා 2500 ක්ලබා දීම හා ව්‍යවසායකත්ව සංවර්ධනය | | | 100% |
| | | • වයස අවු 18-60 ත් අතර පුද්ගලයන් හඳුනාගෙන රැකියා අවස්ථාව සැලසීම සඳහා පුහුණු කිරීම 16 ක් පැවැත්වීම | | | 100% |
| | | • වැඩිහිටි ව්‍යවසායකයන් 50 ක් තොරතුරු ලබාගැනීම හා හඳුනාගැනීම | | | 100% |
| **09. සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම.9** | සංවර්ධන වෙමින් පවත්නා රටවල දේශීය තාක්ෂණ සංවර්ධනය,පර්යේෂණ සහ නවෝත්පාදනය සඳහා සහය ලබා දීම , එකිනෙකා අතර කර්මාන්ත විවිධාංගිකරණය සහ නිෂ්පාදනයන් සඳහා වටිනාකම එකතු කිරීම සඳහා යෝග්‍ය ප්‍රතිපත්ති වාතාවරණයක් සැකසීම | පුද්ගලයන්ට වෙළඳපලට පිවිසීමට අවශ්‍ය සහය ලබාදීම 1600 | | | 100% |
| | | යටිතල පහසුකම් සංවර්ධනය-02 | | | 100% |
| | | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යසායකින් බිහිකිරීම අරමුණින් Business Desk වැඩසටහන ක්‍රියාත්මක කිරීම - 16 | | | 90% |
| | | පාසල් හැරයන තරුණ තරුණියන් වෘත්තිමය කුසලතා වර්ධනයට උපායමාර්ගික සැලැස්ම(Lead to Leed) ක්‍රියාත්මක කිරීම- 16 | | | 100% |
| **10.** රටවල් තුළ සහ ඒවා අතර අසමානාත්‍යතාවය අඩුකිරීම | **2030 වන විට වයස,ලිංගික බව,ආබාධිත බව, ජන වර්ගය,ජාතිය,ආගම හෝ ආර්ථික හෝ වෙනත් තත්වයක් පිළිබඳව තැකීමකින් තොරව සියළුදෙනාගේ සමාජ ආර්ථික සහ දේශපාලනික අන්තර්කරණය සවිබල ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම** | සවිබල ගැන්විය යුතු පවුල් /පාර්ශවයන් සවිබල ගැන්වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම - 16 | | | 100% |
| **11. නගර හා ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත,සවිමත් සහ තිරසර ලෙස සකස් කිරිම.** | 2030 වන විට විශේෂයෙන්ම වාතයේ ගුණාත්මකභාවය සහ නාගරික සහ වෙනත් අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුලත්ව නගරය නිසා සිදුවන ඒක පුද්ගල අහිතකර බලපෑම අඩු කිරීම. | • ඉඩම් පරිහරණ සැලසුම් 10 ක් සැකසීම | | 70% | |
| | | • රුක් රෝපණ ව්‍යාපෘති 32 ක් ක්‍රියාත්මක කිරීම | | | 100% |
| **15. භූගෝලීය පරිසර පද්ධතින්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරිකරණයට එරෙහිව ක්‍රියාකිරීම, ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම.** | ජීව විවිධත්වයන් සහ පරිසර පද්ධති සංරක්ෂණ කිරීමට සහ තිරසර අන්දමින් භාවිතා කිරීමට සියලුම මූලාශ්‍රයන්ගෙන් මූල්‍ය ප්‍රතිපාදන රැස් කිරීමට උනන්දු කිරීම | • ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් 04 ක ක්‍රියාත්මක කිරීම | | | 75% |
| | | • රුක් රෝපණ වැඩසටහන් 32 ක් ක්‍රියාත්මක කිරීම | | | 100% |
| **16. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමකම ඵලදායි වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩ නැගීම.** | උපත් ලියාපදිංචි කිරීමද ඇතුළුව 2030 වන විට සියළු දෙනාටම නීතිමය අනන්‍යතාවක් ලබාදීම | • ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 16ක් පැවැත්වීම | | | 100% |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

**අභියෝග**

1. දරිද්‍රතාවය ඉහල යාමට, සෞඛ්‍ය සම්පන්න නිරෝගී ජීවිත අහිමි වීමට, ගුණාත්මක අධ්‍යාපනයක් අහිමි වීමට ආදි වූ කරුණු රාශියකට හේතුවක් වූ මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට විවිධ වූ දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වූවද මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වන පිරිස දිනෙන් දින වැඩිවීම සිදුව ඇත.
2. සියළුම ජනතාවට ආරක්ෂිත පෝෂ්‍යදායි ප්‍රමාණවත් ආහාර ලැබීම තහවුරු කිරීම සාක්ෂාත් කිරීමේ දී ප්‍රබල ගැටළුවක්ව පවතින්නේ වසරේ වැඩි කාලයක් වියළි දේශගුණයක් පවතින පුත්තලම දිස්ත්‍රික්කය තුල ඇතිවන නියඟ තත්වය නිසා ගොවිතැන් විනාශ වීම සහ සතුන් විසින් ගොවිතැනට හානි කිරීම.
3. මධ්‍යම පළාතට, කුරුණෑගල දිස්ත්‍රික්කයට හා අනුරාධපුර දිස්ත්‍රික්කය යන ප්‍රදේශ වලට ඇදහැලෙන අධික වැසි ජලය පුත්තලම දිස්ත්‍රික්කය හරහා මුහුදට ගලා බසියි. පුත්තලමට අධික වැසි ඇති නොවූවද දිස්ත්‍රික්කයේ පවතින භූගෝලීය පිහිටීම නිසා ගංවතුර ආපදාවන්ට නිරන්තරයෙන් මුහුණ දීමට සිදුවීම අභියෝගයකි.
4. 2022 සිට මුහුණු දුන් ආර්ථික අර්බුද තත්වය ප්‍රධාන අභියෝග විය.

# 6 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| ශ්‍රේණිය | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 56 | 55 | 01 |
| තෘතියික | 40 | 23 | 17 |
| ද්විතියික | 1153 | 1083 | 70 |
| ප්‍රාථමික | 178 | 113 | 65 |

**6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය**




## 6.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

දැනට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අදාළ අංශ වෙත තොරතුරු දැනුම් දී ඇත. ජ්‍යෙෂ්ඨ සහ තෘතිකපුරප්පාඩු තනතුර වලට අදාළ රාජකාරි කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අභ්‍යන්තර වැඩපිළිවෙලක් යොදා ඇත. (රාජකාරි ආවරණ ,වැඩ බැලීම, රාජකාරි ඉටුකිරීම ) ද්වීතීයික නිලධාරින්ගේ පුරප්පාඩු සඳහාසංවර්ධනනිලධාරින් යොදවා රාජකාරි අඛණ්ඩව ක්‍රියාත්මක කරයි.ප්‍රාථමික පුරප්පාඩු තනතුර වලට අදාළ රාජකාරි කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට බහු කාර්‍ය නිලධාරින් යොදවා ඇත.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| අනු අංකය | වැඩසටහන | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහන් කාල සීමාව (දින) | සමස්ථ ආයෝජනය දේශීය | ස්වභාවය ( දේශීය/විදේ | නිමැවුම/ ලබා ගත්දැනුම* |
|---|---|---|---|---|---|---|
| 1 | විනය කාර්‍ය පටිපාටිය , ලිපිගොනුකරණය හා වාර්තාකරණය | 158 | 1 | 30,000 | දේශීය | ඉහල ඵලදායිතාවයක් ලබා ගැණීම |
| 2 | මුදල් රෙගුලාස පිළිබඳ පුහුණුව | 60 | 1 | 6,440 | දේශීය | නිලධාරීන්ට මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම ලබා දී ඇත |
| 3 | ආයතන සංග්‍රහය, කාර්ය පටිපාටික රීති, කාර්යාල කළමනාකරණය සහ කාර්යාල ක්‍රමය | 145 | 1 | 26,500 | දේශීය | කාර්යාලය නිලධාරීන්ගේ නිවැරදි බව රාජකාරි පවත්වාගෙන යාමට දැනුමක් වර්ධන කිරීම |
| 4 | කාර්යාල ක්‍රම ප්‍රායෝගික භාවිතය සහ පෞද්ගලික ලිපිගොනු නඩත්තුව පිළිබඳ පුහුණුව | 166 | 1 | 33670 | දේශීය | පෞද්ගලික ලිපිගොණු කරණය සම්බන්ධ අවබෝධයක් ලබා ගැනීම |
| 5 | ග්‍රාමීය සංවර්ධන පුහුණු | 40 | 1 | 2,450 | දේශීය | පුහුණු ව්‍යාපෘතියක් තෝරා ගැනීම සහ නිවැරදිව ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ගන්නා ක්‍රමවේදය පිළිබඳ අවබෝධය ලබා ගැනීම |
| 6 | ව්‍යාපෘති කළමණාකරන හා ඉදි කිරීම කටයුතු පිළබඳ පුහුණුව | 20 | 2 | 8,460 | දේශීය | සංවර්ධන නිලධාරින් ධාරිතා සංවර්ධනය කර වඩා ගුණාත්මක සේවාවක් ලබා දීමේ සහ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් විගණන විමසුම් අවම කර ගැනීම |
| 7 | අත්තිකාරම් ලබාගැනීමල වවුචර්පත් පිළියෙල කිරීම ආදි ගිණුම් අංශයට අදාල රාජකාරි පිළිබඳ පුහුණු වැඩසටහන | 51 | 1 | 5430 | දේශීය | දැනුම කුසලතාව වර්ධනය තුළින් ඵලදායිතාව වැඩි කිරීම |
| 8 | සේවාලාභී සත්කාරය ආචාර ධර්ම හා යහපත් සන්නිවේදනය පිළිබඳ පුහුණු වැඩසටහන | 324 | 1 | 68248 | දේශීය | නිලධෘරීන් හා සේවාලාභීන් අතර මනා සම්බන්ධයක් ඇති කිරීම |
| 9 | ධනාත්මක චින්තනය හා ආකල්ප වර්ධනය | 120 | 1 | 37,900 | දේශීය | කාර්යාලගත හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ආකල්ප වැඩි දියුණු කරමින් ගුණාත්මක රාජ්‍ය සේවයක් ඇති කරනු වස් ධනාත්මක සිතුවිලි තුලින් තෘප්තිමත් රාජ්‍ය සේවයක් ඇති කිරීම |
| 10 | මානව සබඳාත්මක කුසලතා වර්ධනය | 111 | 1 | 20,000 | දේශීය | කාර්යාල ජීවිතයේදී නිලධාරින්ගේ හැසිරීම හා විනය හරි ආකාරයෙන්ම පවත්වාගත යුතු ආකාරය |
| 11 | විනය කාර්ය පටිපාටි හා ආකල්ප සංවර්ධනයපිළිබඳ පුහුණුව | 447 | 1 | 73130 | දේශීය | නවක නිළධාරින් හා සියළුම සියළුම කාර්යාලගත නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම |
| 12 | බලශක්ති , කසළ කළමණාකරණය , තිරසාර සංවර්ධනය හා වැඩ බිම් ආරක්ෂාව සම්බන්ධ දේශනය | 100 | 1 | 11,000 | දේශීය | ඵලදියීතා වර්ධනය |
| 13 | පරිගණක පුහුණු | 106 | 1 | 50,000 | දේශීය | ඵලදියීතා වර්ධනය |
| 14 | ආයතන කාර්යපටිපාටිය, පිලිබඳව වෘත්තීය සහතිකපත්‍ර පාඨමාලාව | 2 | 10 | 40,000 | දේශීය | ඵලධායිතා වැඩිවීම |

# 07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම) | අදාල නැත | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නැත | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නැත | | |
| 1.6 | වෙනත් | අදාල නැත | | |
| **2** | **පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.7 | බඩු වට්ටෝරු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය ( GA – N 20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මුල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මුල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.01 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අය වැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂිකමුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **5** | **විගණනවිමසුම්** | | | |

| | | | | |
|---|---|---|---|---|
| **5.1** | විගණනකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට,සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව ,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව , අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වැනි පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිළධාරියෙකු පත් කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | වසර ගණනාවකට පෙර සිට පැවත එන හිඟ හිටි ණය ශෙෂ ඇත.එම ණය ශේෂය කපාගැනීමට අවශ්‍ය කටයුතු කරමින් තිබේ. | භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 118 අනුව ණය ගෙවීම් පියවනු ලැබේ. |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව , රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිළධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක නර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | තිබීම | | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්මතුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහතචක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරවමානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම , ධාරිතාසංවර්ධනවැඩසටහන් සංවර්ධනය කිරීම , නිපුණතාසංවර්ධනවැඩසටහන්ක්‍රියාත්මක කිරීම පිළිබඳවගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | | |
| **20** | **විද්‍යුත් පළාත්පාලන පද්ධතියක් ස්ථාපිතකිරීම** | | | |
| 20.1 | 2018.07.19 දිනැතිපළාත් පාලන චක්‍ර ලේක අංක 2018/e-Local Government-01 අනුවඅන්තර්ජාලයහරහා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමටපුරවැසියන්ට පහසුකම් සලසා තිබීම. | අදාල නොවේ. | | |
| 20.2 | අන්තර්ජාලයහරහා ගෙවීම් සිදුකිරීමටපුරවැසියන්ට පහසුකම් සලසාතිබීම . | අදාල නොවේ. | | |
| 20.3 | පාරිභොගින්ටහිතකර සේවාව සැපයීමෙ සඳහාපෙරටුකාර්යාලය හා (Front Offices) පාරිභොගික සේවා මධ්‍යස්ථානය හඳුන්වා දී තිබීම. | අදාල නොවේ. | | |